# මුදල් මණ්ඩලය
# ශ්‍රී ලංකා මහ බැංකුව

**2021 මාර්තු 12** **චක්‍රලේඛය** **2021 අංක 04**

## මගී ප්‍රවාහන සේවයේ නියුතු ව්‍යාපාර හා පුද්ගලයන් විසින් ලබා ගත් කල්බදු මූල්‍යකරණ පහසුකම් (ලීසිං) සඳහා ලබා දෙන සහන යෝජනා ක්‍රමය

මගී ප්‍රවාහන සේවයේ නියුතු ව්‍යාපාර හා පුද්ගලයන් හට කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය නිසා සිදුවූ දුෂ්කරතා සැලකිල්ලට ගනිමින්, එසේ දුෂ්කරතා වලට මුහුණ දුන් මගී ප්‍රවාහන සේවයේ නියුතු ව්‍යාපාර හා පුද්ගලයන් විසින් ලබා ගෙන ඇති කල්බදු මූල්‍යකරණ පහසුකම් ආපසු ගෙවීම සඳහා 2021 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, මාස හයක කාල සීමාවක් සඳහා, පහත දක්වා ඇති පරිදි ණය සහන යෝජනා ක්‍රමයක් (මින් ඉදිරියට යෝජනා ක්‍රමය ලෙස හැඳින්වෙන) ක්‍රියාත්මක කරන ලෙසට ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් (මින් ඉදිරියට බැංකු නොවන මූල්‍ය ආයතන ලෙස හැඳින්වෙන) වෙත ඉල්ලීමක් කර ඇත.

ඒ අනුව, සියලුම බැංකු නොවන මූල්‍ය ආයතන විසින් සමාන ලෙස ඉහත ණය සහන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කර ඇත.

### 1. කල්බදු වාරික කල්දැමීමේ කාල සීමාව

1.1. සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන් මුහුණ දෙන මූල්‍ය දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් බැංකු නොවන මූල්‍ය ආයතන විසින් 2021 අප්‍රේල් මස 1 සිට හය මසක කාල සීමාවක් නොඉක්මවන හෝ අදාළ පරිදි ඊට අඩු කාල සීමාවක් සඳහා කල්බදු වාරික කල් දැමීම සිදු කළ හැක.

1.2. බැංකු නොවන මූල්‍ය ආයතන විසින් දුෂ්කරතා වලට මුහුණපා ඇති ණය ගැනුම්කරුවන් විසින් කරන්නා වූ ඉල්ලීම් අනුව, කල්බදු වාරික (මුල් මුදල සහ පොලිය යන දෙකම) කල් දැමීම සිදු කළ හැක.

### 2. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය

2.1 සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන් විසින් 2021 අප්‍රේල් 19 දින හෝ ඊට පෙර කල්බදු වාරික කල් දැමීම සඳහා ඉල්ලීමක් ලිඛිතව හෝ විද්‍යුත් මාධ්‍යයෙන් යොමු කළ යුතුය. බැංකු නොවන මූල්‍ය ආයතන විසින් දුෂ්කරතා වලට මුහුණපා ඇති ණය ගැනුම්කරුවන් හට ලබා දෙනු ලබන ණය සහන, අයදුම් කළ යුතු අවසාන දිනය සහ අයදුම්පතේ ආකෘතිය මුද්‍රිත

සහ/හෝ විද්‍යුත් මාධ්‍යයෙන් (විද්‍යුත් තැපැල් සහ කෙටි පණිවිඩ සේවා ඇතුලත්ව) ප්‍රකාශයට පත් කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය.

2.2 සාධාරණ හේතුවක් මත ණය සහන සඳහා ඉල්ලුම් කිරීම ප්‍රමාද වී ඇත්නම් පමණක්, 2021 අප්‍රේල් 19 දිනෙන් පසු ඉදිරිපත් කරන ඕනෑම ඉල්ලුම්පතක් බැංකු නොවන මූල්‍ය ආයතන විසින් පිළිගත යුතුය.

**3. සුදුසුකම් ලබන ගනුදෙනුකරුවන්**

3.1 පොදු මගී ප්‍රවාහන පහසුකම් සපයන්නන්, පාසල් ළමුන් ප්‍රවාහන සේවා, කාර්යාල මගී ප්‍රවාහන සේවා, ත්‍රී රෝද රථ ඇතුලු කුලී රථ සේවා ආදී පුද්ගලික මගී ප්‍රවාහන සේවා සපයන සහ සංචාරක ක්ෂේත්‍රය සඳහා මගී ප්‍රවාහන පහසුකම් සපයන ව්‍යාපාර සහ පුද්ගලයන් මෙම යෝජනා ක්‍රමය සඳහා සුදුසුකම් ලබයි.

3.2 ඉහත 3.1 ඡේදයේ සඳහන් කර ඇති අංශ සඳහා මගී ප්‍රවාහන පහසුකම් සැලසීම සඳහා අදාළ වාහනය භාවිත කරන බව තහවුරු කර ගැනීමට අවශ්‍ය ලියවිලි සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන්ගෙන් ඉල්ලා සිටීමට බැංකු නොවන මූල්‍ය ආයතනයන්ට හැකියාව ඇත.

**4. සුදුසුකම් ලබන ණය පහසුකම්**

2021 මාර්තු 31 දිනට සක්‍රීය තත්ත්වයේ පවතින පෙර ණය සහන යෝජනා ක්‍රම යටතේ ණය සහන ලබා ගත් ණය ගැනුම්කරුවන් ඇතුලු ඉහත අංක 03 හි දැක්වෙන්නා වූ කල්බදු මූල්‍යකරණ පහසුකම්.

**5. ණය සහන කාලයේ සැකැස්ම**

5.1 **පවත්නා කල්බදු මූල්‍යකරණ පහසුකම් හි කාල සීමාව දීර්ඝ කිරීම**

(අ) බැංකු නොවන මූල්‍ය ආයතන විසින් කල් දැමීමට සුදුසුකම් ලබන කල්බදු මූල්‍යකරණ පහසුකම් වල ආපසු ගෙවීමේ කාල සීමාව අදාළ කල් දැමීමේ කාල සීමාවෙන් දීර්ඝ කළ යුතුය.

(ආ) මෙලෙස කල් දැමූ කල්බදු මූල්‍යකරණ පහසුකම් වාරික සඳහා පමණක්, කල් දැමූ කාල සීමාව වෙනුවෙන් පොලියක් අය කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතන වලට හැකියාව ඇති අතර එම පොලී අනුපාතය, 2021 අප්‍රේල් 01 දිනට ආසන්නතම දිනකදී පවත්වන දින-364

භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේ පොලී අනුපාතයට සියයට 5.5 ක් එකතු කළ වාර්ෂික පොලිය විය යුතු අතර එම වාර්ෂික පොලී අනුපාතය සියයට 11.5 ක අගය නොඉක්මවිය යුතුය.

(ඇ) කල් දැමූ වාරික සඳහා උපචිත වූ පොලිය, 2023 අප්‍රේල් මස සිට කාල සීමාවට අදාළ කල්බදු වාරිකය සමඟ මාසිකව අයකර ගත යුතුය. 2023 අප්‍රේල් මාසයට පෙර කල්බදු මූල්‍යකරණ පහසුකමෙහි කාල සීමාව අවසන් වුවහොත්, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් පවත්නා කල්බදු මූල්‍යකරණ පහසුකමෙහි කාල සීමාව අවසන් වූ විට පොලිය අයකර ගැනීම ආරම්භ කළ හැකිය.

(ඈ) කල්බදු මූල්‍යකරණ පහසුකමෙහි පවත්නා කාල සීමාව අවසන් වූ පසු, ඉහත 5.1 (අ) ඡේදයේ සඳහන් පරිදි ණය ගැනුම්කරු විසින් කල් දැමූ වාරික ආපසු ගෙවීම ආරම්භ කළ යුතුය.

5.2 **පෙර ණය සහන යෝජනා ක්‍රමයන්හි වාරික අයකර ගැනීම**

(අ) පාසල් ,කාර්යාල, ගුවන්තොටුපල යනාදිය යළි විවෘත කිරීම හේතුවෙන් (බොහෝ ප්‍රවාහන සැපයුම්කරුවන්ට මාසික ගාස්තු අඛණ්ඩව ලබා ගැනීමට හැකියාව ලැබීම), පොදු හා පුද්ගලික ප්‍රවාහන භාවිතය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම, දීර්ඝ කරන ලද ණය සහන යෝජනා ක්‍රමය නිසා බැංකු නොවන මූල්‍ය ආයතන වලට වන බලපෑම සහ පවත්නා එන්නත්කරණ වැඩ පිළිවෙල ආදී කරුණු සැලකිල්ලට ගනිමින් 2019 අප්‍රේල් 01 සිට 2020 මාර්තු 31 දක්වා, 2020 අප්‍රේල් 01 සිට 2020 සැප්තැම්බර් 30 දක්වා සහ 2020 ඔක්තෝබර් 01 සිට 2021 මාර්තු 31 දක්වා කාලය තුළ ලබා දී ඇති ණය සහන යෝජනා ක්‍රම (මින් ඉදිරියට පෙර ණය සහන යෝජනා ක්‍රම ලෙස හැඳින්වෙන) වලට අදාළ වාරික, ඉහත 5.1 (අ) ඡේදයේ සඳහන් කල්බදු වාරික කල්දැමීමේ කාල සීමාවේ දී අය කර ගැනීම ආරම්භ කළ යුතුය.

(ආ) ඉහත 5.2 (අ) ඡේදයේ සඳහන් පරිදි පෙර ණය සහන යෝජනා ක්‍රමයන්හි ඉතිරි වාරික ආපසු ගෙවීම, පවත්නා කල්බදු මූල්‍යකරණ පහසුකමෙහි දීර්ඝ කළ කාල සීමාව ඇතුලුව ආපසු ගෙවීමේ සීමාව අවසන් වන තෙක් කල් දැමිය යුතුය.

(ඇ) පෙර ණය සහන යෝජනා ක්‍රමයන්හි ඉතිරි වාරික වල කල් දැමූ කාල සීමාව සඳහා, 2021 අප්‍රේල් 01 දිනට ආසන්නතම දිනකදී පවත්වන දින-364 භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේ පොලී අනුපාතයට සියයට 5.5 ක් එකතු කළ වාර්ෂික පොලියට නොවැඩි පොලී අනුපාතයක් අයකර ගත හැකි අතර එය වාර්ෂික පොලී අනුපාතය සියයට 11.5 ක අගය නොඉක්මවිය යුතුය.

(ඈ) 5.2 (ආ) ඡේදයේ සඳහන් කර ඇති පෙර ණය සහන යෝජනා ක්‍රමයන්හි කල් දැමූ වාරික සඳහා අදාළ උපචිත පොලිය, ඉහත 5.1 (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් පොලිය ගෙවීම අවසන් වූ වහාම කල්බදු මූල්‍යකරණ පහසුකමෙහි වාරික සහ කල් දැමූ වාරික සමඟ මාසිකව අයකර ගත යුතුය.

(ඉ) කල්බදු මූල්‍යකරණ පහසුකමෙහි කල් දැමූ කාල සීමාව ඇතුලුව පවත්නා කාල සීමාව අවසන් වූ පසු, ඉහත 5.2 (ආ) ඡේදයේ සඳහන් පෙර ණය සහන යෝජනා ක්‍රමයන්ට අදාළ ඉතිරි වාරික ආපසු ගෙවීම ණය ගැනුම්කරුවන් විසින් ආරම්භ කළ යුතුය.

5.3 ණය සහන යෝජනා ක්‍රම තුල ගෙවීමට ඇති හිඟ මුදල සහ කල් දැමූ කාල සීමාව සඳහා පොලිය ද ඇතුලුව, කල් දැමූ කාල සීමාව තුල ගෙවිය යුතු කල්බදු වාරික ගෙවීම සඳහා ණය ගැනුම්කරු විසින් කලින් ගෙවීමට ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරන්නේ නම්, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් එවැනි ඉල්ලීම් සඳහා පහසුකම් සැපයිය යුතුය. එවැනි අවස්ථාවකදී, බැංකු නොවන මූල්‍ය ආයතන සහ ණය ගැනුම්කරුවන් යන දෙපාර්ශවය විසින් ණය මුදලේ/ගෙවීමේ ව්‍යුහය, පොලී අනුපාතය සහ කාල සීමාව පිළිබඳව එකඟ විය යුතුය.

5.4 මෙම චක්‍රලේඛය යටතේ ලබා දී ඇති ප්‍රතිලාභ වලට වඩා ණය ගැනුම්කරුට ලැබෙන සමස්ත ප්‍රතිලාභ අඩු නොවන අයුරින් ණය ගැනුම්කරුගේ ඉල්ලීම පරිදි බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය ගැනුම්කරුවන්ට අමතර විකල්ප ලබා දිය හැකිය. එවැනි අවස්ථාවකදී, එවැනි සහනයක් අනුමත කිරීමට පෙර, මෙම චක්‍රලේඛයේ යෝජිත ව්‍යුහය ඇතුලුව සියලු විකල්පයන් යටතේ පොලී ගණනය කිරීම සම්බන්ධයෙන් බැංකු නොවන මූල්‍ය ආයතන විසින් පැහැදිලි කිරීමක් සිදු කළ යුතුය.

5.5 බැංකු නොවන මූල්‍ය ආයතන විසින් 2021 අප්‍රේල් 01 දින වන විට එකතු වී ඇති සහ නොපියවා ඇති දඩ පොලී කපා හැරිය යුතු අතර තවද, කල් දැමූ කාල සීමාව තුල දී දඩ පොලී එකතු කිරීම හෝ අය කිරීම නොකළ යුතුවේ.

5.6 සහන ලබා දීමේ දී බැංකු නොවන මූල්‍ය ආයතන විසින් අධික ගාස්තු අය නොකළ යුතුය.

5.7 බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය සහන ලබා දීම ප්‍රතික්ෂේප කළ අවස්ථාවන්හී දී, ඒ සඳහා හේතුව පැහැදිලිව සඳහන් කළ යුතුය.

# මුදල් මණ්ඩලය
# ශ්‍රී ලංකා මහ බැංකුව

**2021 මාර්තු 12** **චක්‍රලේඛය** **2021 අංක 04**

**6. කල්බදු වාරික කල් දැමීම සඳහා ගිණුම්කරණය**

බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය සහන කාලසීමාවට අදාළව ගිණුම් තැබීමේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ කොවිඩ්-19 ව්‍යසනය සම්බන්ධව මූල්‍ය වාර්තාකරණයේදී බලපාන කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සපයනු ලබන මාර්ගෝපදේශ වේ නම් ඒ හා අනුගතව කටයුතු කළ යුතුය. බැංකු නොවන මූල්‍ය ආයතන හට මේ සම්බන්ධව අමතර මඟපෙන්වීමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් හෝ විගණකවරුන්ගෙන් විමසිය හැක.

**7. වාර්තාකරණ අවශ්‍යතා**

2021 අප්‍රේල් 30 දින සිට සෑම මසකම බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ආයතන වලින් ණය සහන ලබාගෙන ඇති ගනුදෙනුකරුවන් පිළිබඳ තොරතුරු සෑම මසකම අවසන් දිනයේ සිට වැඩකරන දින 15 ක් තුල දී බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතුය. තොරතුරු ඉදිරිපත් කළ යුතු ආකෘතිය ඉදිරියේ දී යොමු කරනු ලැබේ.

අත්සන් කලේ,

**මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්**

මුදල් මණ්ඩලයේ සභාපති සහ

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

## වැඩි විස්තර සඳහා කරුණාකර ඔබේ ළඟම ඇති ශාඛාව අමතන්න

**<u>අයිඩියල් ෆිනෑන්ස් - සම්බන්ධතා තොරතුරු</u>**

| ශාඛාවේ නම සහ ලිපිනය | ඇමතුම් විස්තර | ශාඛා කළමනාකරුගේ නම | ශාඛා කළමනාකරු සම්බන්ධතා තොරතුරු |
|---|---|---|---|
| අනුරාධපුර ශාඛාව<br>අංක: 09,<br>ප්‍රධාන වීදිය,<br>අනුරාධපුර | දූ.ක. : 025 2237925<br>ෆැක්ස් : 025 2237905 | අකිල ජයතිලක මහතා | ජංගම දුරකථන අංකය<br>0719923730 |
| බණ්ඩාරවෙල ශාඛාව<br>අංක: 339,<br>ජනහිත ගොඩනැගිල්ල,<br>ප්‍රධාන වීදිය,<br>බණ්ඩාරවෙල | දූ.ක : 057 2221025<br>ෆැක්ස් : 057 2230030 | නිලංග ජයලත් මහතා | ජංගම දුරකථන අංකය<br>0718643335 |
| ඇල්පිටියා ශාඛාව<br>අංක 117,<br>ප්‍රධාන වීදිය,<br>ඇල්පිටිය. | දූ.ක : 091 2291427<br>ෆැක්ස් : 091 2291428 | ගයාන් මල්ලවරාච්චි මහතා | ජංගම දුරකථන අංකය<br>0714940022 |
| එම්බිලිපිටියා ශාඛාව<br>අංක: 28,<br>පල්ලෙගම පාර,<br>ඇඹිලිපිටිය | දූ.ක : 047 2261467<br>ෆැක්ස් : 047 2261468 | චින්තක සෙනෙවිරත්න මහතා | ජංගම දුරකථන අංකය :<br>0703564162 |
| ප්‍රධාන කාර්යාලය<br>අංක: 299,<br>යුනියන් පෙදෙස,<br>කොළඹ 02 | දූ.ක : 011 2396060<br>ෆැක්ස් : 011 2396757 | චමත් ජයසිංහ මහතා | ජංගම දුරකථන අංකය :<br>0714940020 |
| යාපනය ශාඛාව<br>අංක: 408,<br>රෝහල් පාර,<br>යාපනය | දූ.ක : 021 2219990<br>ෆැක්ස් : 021 2219991 | කනගනාදන් සුගන්තන් මහතා | ජංගම දුරකථන අංකය:<br>0714940021 |
| මහනුවර ශාඛාව<br>අංක: 119 ඒ,<br>කොටුගොඩෙල්ලා වීදියා,<br>මහනුවර | දූ.ක : 081 2208708<br>ෆැක්ස් : 081 2208709 | සාලියා මාලුදේනියා මහතා | ජංගම දුරකථන අංකය:<br>0718875414 |
| කුරුණෑගල ශාඛාව<br>අංක 33,<br>සුරතිස්ස මාවත, කුරුණෑගල | දූ.ක : 037 2232110<br>ෆැක්ස් : 037 2232010 | සමන් ධර්මසිරි මහතා | ජංගම දුරකථන අංකය<br>0714940027 |
| මාතර ශාඛාව<br>අංක: 91,<br>අනගරිකා ධර්මපාල එම්.<br>මාතර | දූ.ක : 041 2226916<br>ෆැක්ස් : 041 2226912 | යසිතා නාඩුන් ගේබ්රියෙල් මහතා | ජංගම දුරකථන අංකය :<br>0703561472 |
| මොණරාගල ශාඛාව<br>අංක: 100,<br>නව බස් නැවතුම්පොළ,<br>මොණරාගල | දූ.ක : 055 2055858<br>ෆැක්ස්: 055 2055588 | රසිකා බන්දර මහතා | ජංගම දුරකථන අංකය :<br>0719923732 |
| ගම්පහ ශාඛාව<br>අංක 03,<br>බෞද්ධෝකා මාවත, ගම්පහ | දූ.ක : 033 2121321 / 033 2121421<br>ෆැක්ස් : | නිශාන්ත කන්නංගර මහතා | ජංගම දුරකථන අංකය :<br>0703561458 |